56014

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

16 - 11 - 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ...................................................................... විභාග අංකය :- ......................

Learning Center R De Mazenod College Kandana

## I කොටස

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට ඒ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

---

(01) බ්‍රිතාන්‍ය ජාතිකයෝ පෙරදිගට පැමිණීමේ මුල්ම අරමුණ වූයේ මින් කුමක්ද?

(1) පෙරදිග ප්‍රදේශ තම පාලනයට නතු කර ගැනීම
(2) තම ආගම පෙරදිග ප්‍රදේශවල පැතිරවීම
(3) පෙරදිග වෙළඳ බලය අත්පත් කොට ගැනීම
(4) ඉන්දියන් සාගර ප්‍රදේශයේ නාවික බලය ලබාගැනීම

(02) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම මගින් මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ගෙන ගිය පාලනයට එරෙහිව ක්‍රි.ව.1797 විරෝධතා අරගලයක් ඇතිවීමට බලපෑ ආසන්නත ම හේතුව කුමක් ද?

(1) පොල්ගස් බද්ද ජනතාවට මහත් පීඩනයක් වීම.
(2) බදු එකතු කිරීමට අවුම්ල්දාර්වරු පත් කිරීම
(3) බදු වෙන්දේසි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
(4) රා - අරක්කු බද්ද පැනවීම

(03) ශ්‍රී වික්‍රමරාජසිංහ රජුගේ ක්‍රියාකලාපයට විරුද්ධව සබරගමුවේ කැරැල්ලක් ඇති කළ අදිකාරම් වරයාගේ නම සඳහන් පිළිතුර තෝරන්න.

(1) පිළිමතලව්වේ මහ අදිකාරම් ය. (2) මොල්ලිගොඩ අදිකාරම් ය.
(3) ගොඩේගෙදර අදිකාරම් ය. (4) ඇහැලේපොල අදිකාරම් ය.

(04) උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසි කොඩිය එසවීමට විරුද්ධව කටයුතු කළ භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය. (2) කඩහපොළ හිමියන් ය.
(3) වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් ය. (4) පරණතල හිමියන් ය.

(05) ප්‍රථම වරට ව්‍යවස්ථාදායක සභාවට නිල නොලත් බහුතරයක් පත්වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

(1) 1833 - කෝල්බෲක් (2) 1920 මැනිං
(3) 1910 - කෲව් මැකලම් (4) 1924 මැනිං ඩෙවොන්ෂයර්

(06) 1931 වර්ෂයේ දී හඳුන්වා දුන් කෘෂිකර්ම හා ඉඩම්, අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාවන්හි සභාපති ධූරය දැරූ පුද්ගලයන් පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

(1) ඩී.බී.ජයතිලක මහතා - පී.සුන්දරම් මහතා

(2) ඩී.එස්.සේනානායක මහතා - එම්.එච්.මාකන් මාකර් මහතා

(3) සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා - ඩී.බී.ජයතිලක මහතා

(4) ඩී.එස්.සේනානායක මහතා - සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා

(07) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අමාත්‍යවරුන්ට හිමි අමාත්‍යාංශ හා විෂයයන් පැවරීම සිදුකරනු ලැබුවේ,

(1) කථානායකවරයා විසිනි. (2) අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.

(3) අග්‍රාමාත්‍යවරයා විසිනි. (4) බ්‍රිතාන්‍ය රජු හෝ රැජිණ විසිනි.

(08) ඕල්කට්තුමා විසින් මෙරට සිදු කළ බෞද්ධාගමික කටයුතු අතර සමස්ත බෞද්ධ ජනතාව වෙනුවෙන් කරන ලද විශිෂ්ඨ සේවාව කුමක් ද?

(1) පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මගින් බෞද්ධ පුනරුදය ඇති කිරීම

(2) වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කිරීම

(3) බෞද්ධ පාසල් ආරම්භකොට බෞද්ධාගම ඉගැන්වීම

(4) බෞද්ධ පොත් පත් රචනා කොට ආගමික දැනුම වර්ධනය කිරීම

(09) ක්‍රි.ව.1875 වර්ෂයේ දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් පිහිටුවන ලද පිරිවෙන කුමක්ද?

(1) රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන (2) පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන

(3) මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන (4) පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන

(10) ක්‍රි.ව. 1862 දී මෙරට ආරම්භ වූ ප්‍රථම බෞද්ධ පුවත්පත කුමක් ද?

(1) ලංකාලෝකය (2) සිංහල ජාතිය (3) ලක්මිණි පහණ (4) සිංහල බෞද්ධයා

(11) 1815 සිංහල මුස්ලිම් කෝලාහලය දරුණු ක්‍රියාමාර්ග තුළින් මර්දනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

(1) රොබට් විල්මට් හෝර්ටන් (2) රොබට් බ්‍රවුන්රිග්

(3) රොබට් චාමර්ස් (4) ආතර් ගෝල්ඩන්

(12) මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ප්‍රථම වරට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද්දේ කුමන ප්‍රතිසංස්කරණයකින් ද?

(1) 1931 - ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙනි.

(2) 1972 - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

(3) 1947 - සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

(4) 1978 - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

(13) මෙරට අග්‍රාණ්ඩුකාර තනතුර දැරූ ප්‍රථම හා අවසාන අග්‍රාණ්ඩුකාරවරු දක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඔලිවර් ගුණතිලක හා විලියම්ගොපල්ලව

(2) සෝල්බරි සාමි හා ඔලිවර් ගුණතිලක

(3) හෙන්ද්‍රි මන්ක් මේසන් මුවර් සහ ඔලිවර් ගුණතිලක

(4) හෙන්ද්‍රි මන්ක් මේසන් මුවර් සහ විලියම් ගොපල්ලව

(14) ක්‍රි.ව.1953 ඩඩ්ලි සේනානායක මහතා අගමැති තනතුරෙන් ඉල්ලා අස්වීමට හේතුව සඳහන් වන පිළිතුර තෝරන්න.

(1) ජාත්‍යන්තර බලපෑම් එල්ල වූ නිසා ය.
(2) ආහාර මිල ඉහළ යාම හා හර්තාල් ව්‍යාපාරය නිසා ය.
(3) මෙරට දරුණු රෝගයක් පැතිර ගිය නිසා ය.
(4) ඇමති මණ්ඩලයේ පිරිසක් ඉල්ලා අස්වූ නිසා ය.


(15) ක්‍රි.ව.1972 ශ්‍රී ලංකා ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ව්‍යවස්ථාදායකය හැඳින්වූයේ කුමන නමකින් ද?

(1) රාජ්‍ය මන්ත්‍රණ සභාව (2) පාර්ලිමේන්තුව
(3) ජාතික රාජ්‍ය සභාව (4) ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව

(16) ජනතාව ඍජුවම නීති සම්පාදනයට සහභාගී වන මැතිවරණයක් වන්නේ,

(1) ජනමත විචාරණයයි. (2) ජනාධිපති වරණයයි.
(3) පළාත් සභා මැතිවරණයයි. (4) පාර්ලිමේන්තු මැතිවරණයයි.

(17) යාබද පින්තූරයෙන් දක්වෙන්නේ,



(1) නිදහස් චතුරස්‍රයයි.
(2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) ජනාධිපති මන්දිරයයි.
(4) පැරණි පාර්ලිමේන්තුවයි.

(18) 16වන සියවසේ දී තම බලය ව්‍යාප්ත කිරීමට කටයුතු කළ යුරෝපා රටවල් දෙක වනුයේ,

(1) ඕලන්දය හා පෘතුගාලය (2) පෘතුගාලය හා ස්පාඤ්ඤය
(3) ප්‍රංශය හා මහා බ්‍රිතාන්‍යය (4) පෘතුගාලය හා ප්‍රංශය

(19) පහත A හා B තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. අමද්‍යප ව්‍යාපාරයේ පියා | A - පොන්නම්බලම් අරුණාචලම් මහතා |
| 2. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති | B - අනගාරික ධර්මපාලතුමා |
| 3. තරුණ බෞද්ධ සංගමයේ පුරෝගාමියා | C - ආතර් වී දියෙස් මහතා |
| 4. සාරනාත් හි මූල ගන්ධකුටි විහාරය කරවීම | D - දොන් බාරොන් ජයතිලක මහතා |

(1) CABD (2) ADBC (3) CADB (4) BADC

(20) ඇමරිකා එක්සත් ජනපදය පළමුවෙනි ලෝක යුද්ධයට සම්බන්ධ වීමට හේතුව කුමක් ද?

(1) ජපානය විසින් පර්ල් වරායට පහරදීම
(2) හිට්ලර් විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම
(3) ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු සරයේවෝ නම් ස්ථානයේ දී මරා දැමීම
(4) ලුසිටානියා නැවට ජර්මනිය පහරදීම

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යයි.
- ඉතිරි ප්‍රශ්න හයෙන් හතරකට පිළිතුරු සපයන්න.

(01) තුන්වන වාරය අවසානයේ ඉතිහාසය විෂයය යටතේ කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම කුමක් ද? (ලකුණු 02)

(ii) පන්තියේ ශිෂ්‍ය කණ්ඩායම්වලට ලැබුණු මාතෘකා තුන මොනවා ද? (ලකුණු 03)

(iii) ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළව තොරතුරු රැස්කළ අනුමාතෘකා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) ක්‍රියාකාරකම කිරීමට මත්තෙන් ඔබ කණ්ඩායම්වලට ලබාදුන් ගුරු උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)

(v) මෙම ක්‍රියාකාරකම කිරීමේ දී කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම තුළින් ඔබ ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(vi) ඔබගේ නිර්මාණය වඩාත් සාර්ථක නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීමට කණ්ඩායම ගත් ක්‍රියාමාර්ග කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

(02) (i) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම විසින් මුහුදුබඩ ප්‍රදේශවාසීන් සඳහා පැනවූ බදු වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ක්‍රි.ව.1897 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට විරුද්ධව මුහුදුබඩ ප්‍රදේශවාසීන් කළ අරගලයට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) බටහිර ජාතීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ ත්‍රිකුණාමල වරායේ පිහිටීමයි. එහි වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) ක්‍රි.ව.1818 හා 1848 උඩරට නිදහස් අරගල පවතින විට මෙරට පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු දෙදෙනා පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) 1818 නිදහස් අරගලයක් ඇතිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) පහත සඳහන් පුද්ගලයින් හඳුනාගෙන A හා B ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A


B


(i) A රූපයෙන් දක්වෙන කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන විට මෙරට සිටි ආණ්ඩුකාරවරයා කවුරුන්ද?

B රූපයෙන් දක්වෙන පුද්ගලයා හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

(ලකුණු 02)

16 . 11 . 2016

(ii) පහත දක්වෙන තොරතුරුවලට අදාළ පුද්ගලයන් අනුපිළිවෙළින් නම් කරන්න.

A. ක්‍රි.ව. 1889 ව්‍යවස්ථාදායකය නියෝජනය කළ උඩරට සිංහල නියෝජිතයා

B. සීමිත ඡන්ද බලයෙන් ප්‍රථම වරට ව්‍යවස්ථාදායකය නියෝජනය කළ උගත් ලාංකික මන්ත්‍රීවරයා

C. රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්වූ ප්‍රථම කතානායකවරයා

D. ඩී.ඇස්.සේනානායක මහතාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කර දුන් ලංකා විශ්ව විද්‍යාලයේ උපකුලපති වරයා. (ලකුණු 04)

(iii) ක්‍රි.ව.1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලාංකිකයන්ට යම් ප්‍රමාණයකට දේශපාලන බලය හිමිවූ බව එහි ප්‍රධාන යෝජනා දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) ක්‍රි.ව. 1948 සිට ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් සිදුවීම්වලට සම්බන්ධ අගමැතිවරුන්ගේ නම් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම

B. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීම

C. ඉන්දියානු අගමැති ලාල් බහදූර් ශාස්ත්‍රී සමඟ ගිවිසුමක් අත්සන් කිරීම

D. පාර්ලිමේන්තුව තුළ වර්ධනය වූ ආණ්ඩු විරෝධී ව්‍යාපාරය නිසා තනතුරෙන් ඉල්ලා අස්වීම

(ජෝන් කොතලාවල , සිරිමාවෝ බණ්ඩාරනායක, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, ඩී.එස්.සේනානායක) (ලකුණු 04)

(iii) ක්‍රි.ව. 1956 මහ මැතිවරණයෙන් මහජන එක්සත් පෙරමුණට විශාල ජයග්‍රහණයක් ලබාගැනීමට හේතු වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් අන්වර්ථ නාමයන්ගෙන් හැඳින්වෙන පුද්ගලයන් වරහන් තුළින් තෝරා ABCD අනුපිළිවෙළින් ලියන්න.

A. බත් දුන් පියා

B. ආසියාවේ රිදී සීනුව

C. පරිප්පු මහත්තයා

D. බොරලුගොඩ සිංහයා


(ඩී.එස්.සේනානායක, එන්.එම්.පෙරේරා, ඩඩ්ලි සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, පිලිප් ගුණවර්ධන) (ලකුණු 04)

(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

16 · 11 · 2016 Grade 9 History.

(07) (i) යුරෝපයේ අධිරාජ්‍යවාදය ව්‍යාප්ත කිරීමට මුල් වූ රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත දක්වා ඇති සිතියම උපයෝගී කරගෙන A B C D ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A. A අක්ෂරයෙන් දැක්වෙන ඇළ කුමක් ද?

B. හිරු නොබසින අධිරාජ්‍යය ලෙස හැඳින්වූ රට දැක්වෙන අක්ෂරය කුමක් ද?

C. පෘතුගාලය දැක්වෙන අක්ෂරය කුමක් ද?

D. ජපානය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 04)

(iii) දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

Learning Resource Center
R
De Mazenod College
Kandana